# සිංහල බුද්ධ සසුන මුල් ඇල්ලීම

සිංහල බුද්ධ සසුන වෙනස් වී ඇත්තේ කෙසේ දැයි තේරුම්ගැනීමට දහනමවැනි සියවසෙන් මෙපිට කරුණු පමණක් ගෙනහැර දැක්වීම ප්‍රමාණවත් නො වෙයි. බුද්ධ සසුන වෙනස්වීම යන්න යම්කිසි කාලයකට සාපේක්ෂව අධ්‍යයනය කළ යුතු ය. එසේ නැතිව බටහිර සමාජ විද්‍යාඥයන් කරන්නාක් මෙන් අනගාරික ධර්මපාලතුමාගෙන් පසු කාලය ගෙන මෙන්න සිංහල බුද්ධාගම වෙනස් වී ඇතැයි කෑගැසීම මොනයම් ශාස්ත්‍රයකටවත් එකඟ නො වෙයි.

මිහිඳු හිමියන් විසින් පිහිටුවන ලද සිංහල බුද්ධ සසුන එදා මෙදාතුර වෙනස් වී ඇත්තේ කෙසේ ද? එනම් එදාට සාපේක්ෂව අද ඇති වී තිබෙන වෙනස්කම් කවරේ ද? අතරින් පතර පළවන මේ ලිපිවලින් කෙරෙන්නේ ඒ පිළිබඳ මූලික කරුණු කිහිපයක් සැකෙවින් දැක්වීම ය. මෙහි පළවන අදහස් බොහෝමයක් වෙනත් අවස්ථාවල ද, විශේෂයෙන් ම ඉරිදා දිවයිනට අමතරව විදුසර පුවත්පතෙහි ද සඳහන්කර ඇති බව පළමුවෙන් ම කිවයුතු ය.

මිහිඳු හිමියන් මෙරටට වැඩම කරන විට මෙරට තිබූ සමාජය කුමක් ද? විජය රජුගෙන් සංකේතවත්වන පිරිස භාරතයෙන් මෙරටට පැමිණෙන්නට ඇත්තේ ක්‍රිස්තු පූර්ව නමවැනි සියවසේ හා ඉන්පසුව යැයි ආචාර්ය ශිරාන් දැරණියගල මහතා ඉදිරිපත්කර ඇති කරුණු අනුව විශ්වාස කළ හැකි ය. ඇතැම් ඉතිහාසඥයන්ට ආචාර්ය ශිරාන් දැරණියගල මහතාගේ ගවේෂණ පිළිබඳ එතරම් විශ්වාසයක් නොමැති නමුත් ක්‍රිස්තු පූර්ව නමවැනි සියවස ආරම්භයක් ලෙස සැලකීමට ඒ බාධාවක් නොවිය යුතු ය. මෙරටට භාරතයෙන් ඒ පිරිස් පැමිණියේ නැගෙනහිර පැත්තේ සිට යැයි විශ්වාසකිරීමට වාග්විද්‍යාඥයකු වූ මහාචාර්ය කරුණාතිලක මහතාගේ අධ්‍යයනයන් අනුබල දෙයි. එහෙත් ඒ සියල්ලටම වඩා අප නිගමනවලට එළඹෙන්නේ චින්තනය පිළිබඳ ව අප විසින් වර්ධනයකෙරී ඇති අදහස් මත පදනම්වෙමිනි.

ඉතා කෙටියෙන් කියන්නේ නම් ආර්යයන් යැයි අද හැඳින්වෙන පිරිස භාරතයට පැමිණීමට පෙර උතුරේ චීනයේ සිට දකුණේ ලංකාව දක්වා වූ ප්‍රදේශයෙහි විවිධ ගෝත්‍රවලට අයත් පිරිස් ජීවත් වූ නමුත් අඩු වැඩි වශයෙන් ගත්කල ඔවුන්ගේ චින්තන අතර විශාල වෙනසක් නො වී ය. ඒ බව අද ද සිංහලයන් හා චීන ජාතිකයන් අතර ඇති ඇතැම් සමානකම්වලින් පැහැදිලි වෙයි. එහෙත් භාරතය හා ලංකාව ගෝත්‍ර වශයෙන් ගත්කල චීනයට වඩා වෙනස් විය. භාරතයේ හා ලංකාවේ එකම ගෝත්‍රවලට අයත් ජනයා වාසය කළහ. යක්ෂ, නාග ආදී ගෝත්‍රිකයෝ ලංකාවේ මෙන් ම භාරතයේ ද සිටියහ. ඔවුන්ට ඔවුනොවුන්ගේ දෙවිවරු සිටි බවට සැකයක් නැත. මේ දෙවිවරු බොහෝවිට මළගිය ඥාතීහු වූහ. ඔවුන් අතර පුනරුත්පත්තිය පිළිබඳ යම් විශ්වාසයක් ද විය. යෝග භාවනා ආදිය ද ඔවුන් අතර වර්ධනය වී තිබෙන්නට ඇත. මළවුන් වැළලීම, ඒ සඳහා සොහොන් බිම් වෙන්කිරීම මේ සංස්කෘතීන්හි ලක්ෂණයක් වූ බව ලංකාවෙන් ද හමු වී ඇති පුරාවිද්‍යාත්මක සාධකවලින් හෙළි වෙයි.

එමෙන් ම ඒ සමාජය අද වචනවලින් නම් මාතෘමූලික යැයි හැඳින්වෙන සමාජයක් ද විය. මාතෘමූලික යැයි කියැවෙන සමාජවල අප දකින ආකාරයට ගැහැණුන්ගේ චින්තනය ප්‍රධාන චින්තනය විය. බටහිර බොරු කසිකබල් ස්ත්‍රීවාදීන් කුමක් කීව ද සමස්තයක් ලෙස ගත්කල පිරිමි සිතන ආකාරය ගැහැණු සිතන ආකාරයෙන් වෙනස් වෙයි. බටහිර ස්ත්‍රීවාදීන් ද සිතන්නේ බටහිර පිරිමි සිතන ආකාරයට බව මේ කසිකබලියන්ට නො තේරෙයි. ගැහැණු පිරිමින්ට වඩා සංයුක්තව සිතති. ඊනියා වාස්තවික ප්‍රවාද ඔවුන්ට නැත. ගැහැණුන්ගේ චින්තනය ප්‍රධාන චින්තනය වූ සමාජවල ප්‍රජනන කාර්යයේ දී හැරෙන්නට පිරිමින් අවශ්‍ය වූයේ ප්‍රධාන වශයෙන් ම ආරක්ෂාව සැපයීම සඳහා ය. ඊනියා මාතෘමූලික සමාජ ද්‍රවිඩ සමාජ බවට දක්වන මතය පට්ටපල් බොරුවකි. ආර්යයන් භාරතයට පැමිණීමට පෙර එහි ආර්යයන් පමණක් නොව ද්‍රවිඩයෝ ද නොසිටියහ. ද්‍රවිඩ යන සංකල්පය ම පසුව තනාගන්නා ලද්දකි.

ආර්යයෝ භාරතයට පැමිණ එතෙක් එහි තිබූ තත්ත්වය වෙනස්කළහ. ඔවුන්ගේ ප්‍රධාන චින්තනය වූයේ පිරිමින්ගේ චින්තනය ය. පිරිමින්ට වියුක්ත ප්‍රවාද රුචිවෙයි. ආර්යයෝ පිරිමි චින්තනය අනුව කටයුතු කළෝ යුද්ධ දක්ෂයෝ වූහ. ආර්යයන්ගේ සංස්කෘතිය භාරතයේ සංස්කෘතිය මෙන් වර්ධනය වී නොතිබුණ ද ඔවුන්ට භාරතයේ සිටි ගෝත්‍ර යුද්ධයෙන් පරාජයකිරීම එතරම් අපහසු කටයුත්තක් නො වීය. යුද්ධය ජයගැනීමෙන් පසු ආර්යයෝ භාරතයේ තිබූ

© Prof. Nalin De Silva

සංස්කෘතියෙන් ද අංග ගනිමින් අළුත්ම සංස්කෘතියක් ගොඩනැගුහ. අපි මේ සංස්කෘතිය වෛදික සංස්කෘතිය ලෙස ද අදාළ චින්තනය වෛදික චින්තනය ලෙස ද ගනිමු.

වෛදික සංස්කෘතිය භාරතයේ වයඹ සිට ක්‍රමයෙන් දකුණට හා නැගෙනහිරට ගලාගියේ ය. ඉන්දියාවේ ඊනියා වාම නැඹුරුවක් ඇති ඉතිහාසඥවරියක වන රොමිලා තාපර මහත්මියට අනුව ඒ ගලායෑම,එනම් ප්‍රචාරණය, යුද්ධයට වඩා සංස්කෘතික දියුණුව නිසා සිදුවූවක් විය. තාපර මහත්මිය මෙහි දී ද වරද්දාගෙන ඇත. සෘජු යුද්ධ නොතිබුණ ද මේ ප්‍රචාරණයට මුල් හේතුව වූයේ යුද්ධ හා යුද්ධ ශක්තිය ය. තාපර මහත්මිය කීමට තැත්කරන්නේ වෛදිකයන්ගේ සංස්කෘතිය භාරතීය ගෝත්‍ර සංස්කෘතීන්ට වඩා දියුණු බැවින් රෙඩ්ෆීල්ඩ්ගේ මහා සම්ප්‍රදාය  චූල සම්ප්‍රදාය ප්‍රවාදයට අනුව ඊනියා මහා සම්ප්‍රදාය පැතිරගිය බව පෙන්වීමට ය. රාමායණය යනු මේ සංස්කෘතික ප්‍රචාරණය සිදු වූ ආකාරය පිළිබඳ කතාව ය. රාමගේ  ජයග්‍රහණය යනු වෛදිකයන්ගේ ජයග්‍රහණය විය. එය ආධ්‍යාත්මික ජයග්‍රහණයක් නොව යුද්ධ ජයග්‍රහණයක් විය. රාවණ කොහේ සිටියත් ඔහු නියෝජනය කෙළේ ආර්යයන් භාරතයට පැමිණීමට පෙර එහි සිටි ගෝත්‍රිකයන් ය. රාමලා සූපර්ණිකාගේ නාසය කැපූහ. සූපර්ණිකාලා, කුවේණිලා එදා භාරතයේ හා ලංකාවේ අද අර්ථයෙන් නම් පාලිකාවෝ වූහ. රාමලා කෙළේ මේ ගැහැණුන් සමාජයේ පහතට ඇද දැමීම ය. එහෙත් අද ද ලංකාවේ හා භාරතයේ (බංගලා දේශය හා පකිස්ථානය ද ඇතුළුව) ගැහැණුන් අගමැතිණියන් ජනාධිපතිනියන් බවට පත්කරගැනීමට අකමැත්තක් නැතිවීමෙන් පෙනී යන්නේ බටහිර විශ්ලේෂකයන් කියන පරිදි ඊනියා වැඩවසම් ලක්‍ෂණයක් නොව රාමලාට යටපත්කිරීමට නොහැකි වූ ගැහැණු චින්තනයක් සමාජයේ තවමත් බලපාන බව ය. (මේ ජනාධිපතිනියන් ජනාධිපතිවරුන් මෙන් කටයුතු කිරීමට යැමෙන් හෙළිවන්නේ ඔවුන් ලබා ඇති බටහිර අධ්‍යාපනයේ විසකුරු බව ය.) පසුකාලීන බමුණන් කෙසේ විග්‍රහකිරීමට උත්සාහ කළ ද රාමායණයේ සීතා යනු පිරිමි චින්තනයක් ඇති සමාජයක ගැහැණියට හිමි තැන පෙන්වන චරිතයකි. සීතාට ගෞරවාන්විත ව සලකා ඇත්තේ රාම නොව රාවණ බව රාමායණයෙන් ම හෙළි වෙයි.  භාරතයේ වූ ගෝත්‍රවලින් අනෙක් ගෝත්‍රවලට විරුද්ධව වෛදික රාමගේ පැත්ත ගත්තෝ හනුමන් ගෝත්‍රිකයෝ ය. හනුමන් රාමගේ සුවච සේවකයකු වූ ආකාරයට පසුකාලීනව භාරතයේ දෙමළ ජනයා බටහිරයන්ගේ විශේෂයෙන් ම ඉංගිරිසින්ගේ සුවච කීකරු සේවකයන් ලෙස කටයුතු කිරීමට ආසියාවේ වෙනත් රටවලට පමණක් නොව අප්‍රිකාවේ රටවලට ද ගෙනයනු ලැබූහ. අද සොල්හයිම්ලා ප්‍රභාකරන් යොදාගන්නේ එදා රාම හා ලක්‍ෂමන හනුමන් යොදාගත් ආකාරයට ය.

වෛදික චින්තනය විසින් යෝග භාවනා වෙනුවට යාග හෝම හඳුන්වා දෙනු ලැබිණි. පසුකාලීනව බටහිරයන් අපට මත්පැන් පුරුදුකළ ආකාරයට ආර්යයයෝ භාරතයට සෝම පානය හඳුන්වා දුන්හ. ගෝත්‍රිකයන්ගේ බහු දේව සංකල්ප වෙනුවට එක දේව සංකල්පය ඉදිරියට පැමිණ බ්‍රහ්මන් දක්වා වර්ධනය විය. එහෙත් බ්‍රහ්මන්ට  යුදෙව් යෙහෝවා දෙවියන් පමණට සමාජයෙන් වෙන් වූ වියුක්ත දෙවි කෙනකු බවට පත්වීමට පැරණි භාරතීය චින්තනය විසින් ඉඩ නොදෙන ලදී. මේ වෛදික චින්තනය නැගෙනහිරට හා දකුණට මුළුමනින් ම ගලායෑමට කල්ගත විය. එබැවින් ක්‍රි පූ 9-6 සියවස්වල විශේෂයෙන් ම නැගෙනහිර ජනයා අර්ධ වෛදික වශයෙන් හැඳින්වීමේ වරදක් නැත. අර්ධ වෛදිකයන් අතර පැරණි සංස්කෘතික ලක්‍ෂණ හා චින්තනය තිබූ බවට සැකයක් නැත. සිදුහත් කුමරු උපත ලැබුයේ මේ සමාජයෙහි ය. එපමණක් නොව ලංකාවට පැමිණියෝ ද නැගෙනහිර විසූ අර්ධ වෛදිකයෝ වූහ. අසිත තවුසා, ආළාර කාළාම, උද්දකාරාමපුත්ත, පස්වග මහණුන් හා  සිදුහත් තවුසා ද යාග හෝම නොව යෝග භාවනා සම්ප්‍රදායට අයත් වූහ. පැරණි භාරතීය චින්තනය වෛදිකයන් කෙරෙහි දක්වන ලද බලපෑම ආරණ්‍යයක ග්‍රන්ථවල සිට දැක්වෙන බව පෙනී යයි. තාපර මහත්මිය කීමට උත්සාහ කරන ආකාරයෙන් වෛදිකයන්ගේ සංස්කෘතිය  උඩ සිට පහතට ගලාගිය එකක් නම් පහත තිබිණි යැයි සැලකෙන සංස්කෘතියක් එසේ උඩින් පිහිටි සංස්කෘතියකට බලපෑම් කෙළේ කෙසේ ද යන්න ගැටළුවක් වෙයි. වෛදික සංස්කෘතියට එරෙහිව යම් ව්‍යාපාරයක් නැගෙනහිර ප්‍රදේශයෙහි තිබූ බව ද පැහැදිලි ය. බුදු සසුන ඇතැම් ඉන්දීය උගතුන් මාක්ස්වාදී දූරමතවල පිහිටා කියන ආකාරයට නැගී ආ වෙළෙඳ පංතියක් විසින් බිහිකෙරුණක් නොව නැගෙනහිර ප්‍රදේශයෙහි ප්‍රචාරණය වෙමින් පැවතුණු වෛදික චින්තනයට හා සංස්කෘතියට එරෙහිව බිහිවූවක් යැයි ගැනීම හේතු සහගත ය. මෙය හුදෙක් ලෞකික හේතුවක් පමණක් බව ද අවධාරණය කළ යුතු ය. භාරතීය බුදු සසුන භාරතයේ බ්‍රාහ්මණ මතවාදවලට විරුද්ධව යෑම පසුකලෙක මැඩපවත්වනු ලැබුව ද පූර්ණ වෛදික සංස්කෘතියක් හා චින්තනයක් නොතිබූ ලංකාවෙහි සිංහල බුදු සසුන මුල් ඇල්ලුවේ ය.

© Prof. Nalin De Silva